**වියදම් ශීර්ෂය 264**

**යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2010**

1. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කටයුතු සම්බන්ධීකරණය හා පාලනය කිරීම. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් කාර්ය සාධනය වැඩි දියුණු කිරීම.

(ii) නීති මගින් පැවරුණු කටයුතු නිලධාරීන් හා සංවිධාන මගින් ගම් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම. ආදායම රැස් කිරීමේදී වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නියෝජිතයා ලෙස කටයුතු කිරීම. විමධ්‍යගත අයවැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. පළාත් සභාවේ කටයුතු සඳහා සහාය වීම. ප්‍රාදේශීය මට්ටමින් පාලනය පිළිබඳ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා පළාත් සභාවේ සහ පළාත් පාලන ආයතනවල මානව සම්පත් සංවර්ධනය හා වැඩි දියුණු කිරීම.

(iii) ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ පළාත් සභාවට හා පළාත් පාලන ආයතනවලට අදාල කටයුතු සිදු කිරීම. පළාත් සභාව විසින් විදේශ අරමුදල් මූල්‍යයන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය මග පෙන්වීම් හා අධීක්ෂණය සැපයීම මගින් තහවුරු කර ගැනීම.

(iv) පළාත් සභාවට හා පළාත් පාලන ආයතනවලට සහාය වීම.

2. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල**

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) යාපනය
(ආ) වේලනෙයි
(ඇ) වලිකාමම් නැගෙනහිර
(ඈ) වලිකාමම් උතුර
(ඉ) වලිකාමම් බටහිර
(ඊ) වලිකාමම් දකුණ
(උ) වඩමරච්චි නිරිත
(ඌ) වඩමරච්චි උතුර
(එ) තෙන්මරච්චි
(ඒ) නල්ලූර්
(ඔ) වලිකාමම් නිරිත

(ii) උපදිසාපති කාර්යාල

(අ) මරුදන්කර්නි
(ආ) ඩෙල්ෆට්
(ඇ) කරෙයිනගර්
(ඈ) කයිට්ස්

## 3. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම ගිණුම් වර්ෂය ආරම්භයේ පිළියෙල කර තිබණි.

## 4. ගිණුම්

### 4.1 මුළු ප්‍රතිපාදනය හා වියදම

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වූ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 ක් හා උපදිසාපති කාර්යාල 04 ක් සඳහා සලසා තිබුණ මුළු ප්‍රතිපාදනය රු.373,011,417 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.372,432,879 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා උපදිසාපති කාර්යාල 04 ක ශුද්ධ ඉතිරි කිරීම් රු.578,538 ක වූ අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 01 ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදම් වර්ගය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 297,925,000 | 302,925,000 | 302,407,537 | 517,463 | 0.17 |
| මූලධන | 60,200,000 | 70,086,417 | 70,025,342 | 61,075 | 0.09 |
| මුළු වියදම | 358,125,000 | 373,011,417 | 372,432,879 | 578,538 | 0.16 |

## 4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සදහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් පහත සදහන් පරිදි එකතුව රු.3,917,884,336 ක් වූ ප්‍රතිපාදන ලබා දි තිබුණු අතර, එම ප්‍රතිපාදන උපයෝජනය පිලිබඳ විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ අංකය | ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ලබා දුන් ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය/අතිරික්තය (2010 දෙසැම්බර් 31 දිනට) |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| 017 | මැතිවරණ දෙපාර්තමේන්තුව | 60,701,350 | 55,039,434 | 5,661,916 |
| 103 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 221,490 | 217,413 | 4,077 |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 415,107,570 | 261,648,730 | 153,458,840 |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 15,869,047 | 9,550,704 | 6,318,343 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | 1,242,785 | 1,008,707 | 234,078 |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 40,000 | 34,900 | 5,100 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 46,815,125 | 45,460,966 | 1,354,159 |
| 121 | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 4,833,469 | 4,709,998 | 123,471 |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 14,875,067 | 14,725,806 | 149,261 |
| 127 | කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 104,228 | 83,058 | 21,170 |
| 128 | සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යාවසාය සංවර්ධන අමාත්‍යාංශය | 1,035,300 | 790,729 | 244,571 |
| 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 12,435,855 | 8,352,201 | 4,083,654 |
| 134 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 372,500 | 370,505 | 1,995 |
| 139 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 12,902,675 | 10,652,486 | 2,250,189 |
| 140 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 500,000 | 297,822 | 202,178 |
| 142 | ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු පිලිබඳ අමාත්‍යාංශය | 1,000,000 | 996,006 | 3,994 |

| | | | | |
|---|---|---|---|---|
| 145 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 199,815,268 | 197,647,950 | 2,167,318 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 1,659,318 | 1,630,453 | 28,865 |
| 160 | පරිසර අමාත්‍යාංශය | 500,000 | - | 500,000 |
| 174 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 1,682,400 | 1,682,400 | - |
| 204 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 11,790,000 | 11,654,680 | 135,320 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 2,000 | 2,000 | - |
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 8,000 | - | 8,000 |
| 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 3,817,548 | 3,636,075 | 181,473 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 434,043,656 | 430,636,388 | 3,407,268 |
| 226 | ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව | 110,170 | 111,518 | (748) |
| 227 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 714,705 | 704,685 | 10,020 |
| 236 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 677,840 | 528,028 | 149,812 |
| 247 | ශ්‍රී ලංකා රේගුව | 1,000,000 | - | 1,000,000 |
| 252 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 2,523,135 | 1,648,419 | 874,716 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 2,670,927,870 | 2,467,894,899 | 203,032,971 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 41,000 | 40,030 | 970 |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 514,365 | 437,211 | 77,154 |
| | | **3,917,884,336** | **3,532,194,201** | **385,690,135** |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) එක් එක් වැය ශීර්ෂය යටතේ තථ්‍ය වියදම ලෙස දැක්වෙන ඉහත සංඛ්‍යාවන්හි දිස්ත්‍රික් ලේකම් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මුදා හරින ලද මුදල් ප්‍රමාණයන්ද ඇතුළත් වේ.

(ii) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය නොමැතිව ප්‍රතිපාදනය ඉක්මවා වියදම් දරා තිබුණි.

(i) සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂ 5 සඳහා සමීක්ෂණ වාර්තාවන් නොමැතිව සමෘද්ධි ප්‍රතිලාභී ගෙවීම් කර තිබුණි.

(ආ) ප්‍රතිලාභීන් කිහිප දෙනෙකු මියගොස් තිබුණද, අනිවාර්ය ඉතිරි කිරීම් අදාල පවුල්වලට ආපසු ගෙවා නොතිබුණි.

(ඇ) 2009 හා 2010 වර්ෂ තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වූ පාවිච්චි කළ සමෘද්ධි මුද්දර පිළිබඳ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ii) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

සමාලෝචිත වර්ෂය තුළ පුනරාවර්තන වියදම් සඳහා රු.437,211 ක මුදලක් දරා තිබුණි. පහත සඳහන් හේතූන් මත ලැබී තිබුණු රියැදුරු බලපත්‍ර ඉල්ලුම්පත් 14,440 කින් තාවකාලික බලපත්‍ර 5,646 පමණක් සමාලෝචිත වර්ෂය තුළ නිකුත් කර තිබුණි.

(අ) එක් මෝටර් රථ වාහන පරීක්ෂකවරයෙකු පමණක් දිස්ත්‍රික්කයට අනුයුක්ත කර තිබුණි. එබැවින් වාහන පැදවීම් පරීක්ෂණ හා විභාගයන් නියමිත දිනයන් තුළ සිදු කිරීමට ඔහුට නොහැකි වී තිබුණි.

(ආ) බොහෝ අයදුම්කරුවන්ට මෝටර් වාහන පැදවීමට හැකියාව නොතිබූ අතර, අයදුම්කරුවන්ගෙන් 25% ක් පමණක් විභාගයෙන් හා පරීක්ෂණවලින් සමත් වී තිබුණි.

(iii) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

සමාලෝචිත වර්ෂය තුළ ඉල්ලුම්පත්‍ර 30,037 ක් ලැබී තිබුණු අතර, ජාතික හැඳුනුම්පත් 27,107 ක් නකුත් කර තිබුණි. ඉතිරි සංඛ්‍යාවෙන් 1,244 ක් වූ ඉල්ලුම්පත් ආපසු යවා තිබුණු අතර, ඉල්ලුම්පත් 1,686 ක් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට යොමු කර තිබුණි.

(iv) ගම නැගුම සහ විමධ්‍යගත අයවැය ව්‍යාපෘති

කරයියූර්හි රෙක්ලමේෂන් මාර්ගය පිළිබඳ වැඩ නිම කර නොතිබුණද, රු.3,512,140 ක් වූ ව්‍යාපෘතියේ මුළු පිරිවැය මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි.

## 4.3 විගණනය හා විගණන විෂය පථය

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 අගෝස්තු 18 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 4.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන් හා රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 4.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙම වාර්තාවේ (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 4.6 සිට 4.16 දක්වා වූ ඡේදවල ඇතුලත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2011 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

| ශීර්ෂය/ විෂය අංකය | ගිණුමේ නම | ඉදිරිපත් කළ දිනය |
|---|---|---|
| 264 | විසර්ජන ගිණුම | 2011 මාර්තු 30 |
| 26401 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් | 2011 මාර්තු 09 |

පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණු අතර, වෙනත් සමහර ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුනු බව විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
| --- | --- | --- |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දැන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි අංක 214 | පවත්වා නොතිබුණි |
| පාඩු හා හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110, 104 (3) සහ (4) | විධිමත්ව පවත්වා නොතිබුණි |
| විසර්ජන (වැය) ලේජරය | මුදල් රෙගුලාසි 447 | විධිමත්ව පවත්වා නොතිබුණි |

(iii) අත්‍යාවශ්‍ය සාක්ෂි ලබා ගැනීමට නොමැති වීම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක රු.3,871,808 ක් වූ ගනුදෙනු විසිතුනක් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**(ආ) අගම ගිණුම**

--------------

අවස්ථා 49 කදී ලබා දුන් එකතුව රු.20,263,192 ක් වූ උප-අග්‍රිම, මුදල් රෙගුලාසි 371 විධිවිධානවලට පටහැනිව අදාල කාර්යය නිමවී මාස 02 සිට 03 දක්වා කාලයක් ගතවීමෙන් පසුව නිරවුල් කර තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

-----------------------

(i) වර්ෂ 2 කට වැඩි කාලයක් ඉක්මවූ රු.882,315 ක තැන්පතු ශේෂයන් 5 ක් පිළිබඳව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබුණු රු.43,402,801 ක මුදලක් අදාල කාර්යයන් සිදු කිරීමෙන් තොරව පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(iii) වැලි බලපත්‍රවලට අදාලව රු.1,988,316 ක රැස් කිරීම් මුදලක් 2009 වර්ෂයේ සිට තැන්පතු ගිණුමේ පැවතුණි. එම ගාස්තු රැස් කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. වැලි බලපත්‍රවලට අදාලව අය කරන ලද මුදලින් රු.71,956,818 ක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය නොමැතිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වැය කර තිබුණි.

(iv) තැන්පතු ගිණුම පිළිබඳ කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(v) ව්‍යාපෘති අරමුදල් - රු.5,400,000

---

2008 වර්ෂය තුළදී ව්‍යාපෘතියක් සඳහා ලැබී තිබූ රු.5,400,000 ක විදේශ ආධාර ප්‍රදානයක් යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණු අතර, අදාල කාර්යයට යොදා ගැනීමෙන් තොරව පසුව ආදායමට බැර කර තිබුණි. මහජන අවශ්‍යතාවයන් පිළිබඳව දිසත්‍රික් ලේකම් කාර්යාලය අවධානය යොමු කර නොතිබුණු බව ඒ අනුව නිරීක්ෂණය විය.

(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

(i) 2010 දෙසැම්බර් 31 දිනට විෂය අංක 26401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශයට අනුව, 2010 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවති ශේෂ එකතුව රු.77,227,119 ක් වූ අතර, එම ශේෂ අයකර ගැනීම් පිළිබඳ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 1996 වර්ෂයේ සිට පැවත එන රු.86,246 ක වෙනස්කම් නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) ණය අය කර ගැනීම් ලේඛන විධිමත්ව පවත්වා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රු.657,292 ක මුදලක් භාණ්ඩාගාර අනුමැතිය ඇතිව හිඟ ණය ශේෂවලින් කපා හැර තිබුණි.

(ඉ) ප්‍රේෂණ ගිණුම්

---

සමාලෝචිත වර්ෂය තුළදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ක්ෂණික වාර්තාවන්හි දැක්වෙන ශේෂ හා මුදල් පොතේ ශේෂ අතර පහත දැක්වෙන වෙනස්කම් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ක්ෂණික වාර්තාව අනුව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුදල් පොතේ මාසික ශේෂය අනුව | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - යාපනය | 529,556,657 | 398,224,667 | 131,331,990 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල - | | | |
| නල්ලූර් | 18,543,028 | 13,811,968 | 4,731,060 |
| වේලනයි | 19,504,558 | 16,378,410 | 3,126,148 |
| වලිකාමම් උතුර | 16,373,284 | 8,884,176 | 7,489,108 |
| යාපනය | 80,574,087 | 37,380,586 | 36,994,602 |
| වලිකාමම් දකුණ | 19,484,105 | 7,680,232 | 11,803,873 |
| වඩමරච්චි උතුර | 18,360,972 | 8,843,688 | 9,517,284 |
| තෙන්මරච්චි | 50,351,467 | 44,957,251 | 5,394,216 |
| වලිකාමම් නැගෙනහිර | 15,838,499 | 9,101,427 | 6,737,072 |
| වඩමරච්චි නිරිත | 39,233,460 | 21,657,332 | 15,892,472 |
| වලිකාමම් නිරිත | 42,198,947 | 12,865,356 | 29,333,591 |
| වලිකාමම් බටහිර | 33,832,471 | 22,494,989 | 11,337,482 |
| | 883,851,535 | 602,280,082 | 273,688,898 |

## 4.6 වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත විග්‍රහ කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති කාලය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|---|
| (i) මෝටර් වාහන | 08 | වර්ෂ 2 සිට 12 දක්වා | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක සහ උපදිසාපති කාර්යාල 02 ක |
| (ii) වෙනත් වත්කම් | 2,380 | වර්ෂ 5 සිට 10 දක්වා | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක |

**(ආ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත මෝටර් වාහන**

සමහර මෝටර් වාහන නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ආයතනය | මෝටර් වාහන අංකය | මෝටර් වාහන වර්ගය | සංඛ්‍යාව |
|---|---|---|---|
| උපදිසාපති කාර්යාලය - ඩෙල්ෆට් | දක්වා නොමැත | මෝටර් ජීප් රථය | 01 |
| | | රෝද දෙකේ ට්‍රැක්ටරය | 01 |
| | | යතුරු පැදිය | 01 |
| උපදිසාපති කාර්යාලය - කයිට්ස් | 500 - 8889<br>152 - 0868 | යතුරු පැදිය | 02 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වෙලනෙයි | 253 - 3378 | පික්අප් රථය | 01 |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - යාපනය | 137 - 8380 | ස්කූටරය | 01 |
| | 63 - 7309 | වෑන් රථ | 01 |
| | | | 08 |

## 4.7 අනුකූල නොවීම්

### (අ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (i) මුදල් රෙගුලාසි | | |
| (අ) මු.රෙ. 69 | 20,491,322 | ශීර්ෂ 264 යටතේ 2010 අප්‍රේල් සහ ජූලි මාසවල අරමුදල් මාරු කිරීමෙන් හෝ පරිපූරක ඇස්තමේන්තුවක් මගින් අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමෙන් තොරව රු.20,491,322 ක වියදමක් දරා තිබුණි. |
| (ආ) මු.රෙ. 74 | 9,041 | අතිරේක වියදම් දැරීමෙන් පසුව පරිපූරක ඇස්තමේන්තුව මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර තිබුණි. |
| (ඇ) මු.රෙ. 756 සහ 1647 (ආ) | - | මොටර් වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ පැවැත්විය යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ සඳහා එම සමීක්ෂණ සිදු කර නොතිබුණි. |
| (ii) රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | |
| (අ) 2004 අගෝස්තු 31 දිනැති අංක 353 (5) | වටිනාකම ලබාගත නොහැක | මෝටර් වාහන 8 ක්, පරිගණක උපාංග 73 ක්, ජෙනරේටර් 6 ක්, ජල පොම්ප 1 ක්, වායු සමීකරණ 2 ක්, ෆොටෝ කොපි යන්ත්‍ර 1 ක් සහ මෙවලම් සහ උපකරණ 2,297 ක් 1997 සිට 2010 වර්ෂය දක්වා නිෂ්කාර්යව පැවතුණි. |

| | | | |
|---|---|---|---|
| | (ආ) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 | 278,975 | කාර්යාල උපකරණ හා වෙනත් විෂයයන් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වෙන්දේසි කර තිබුණි. |
| (iii) | අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 1,828,152 | චක්‍රලේඛයේ අවශ්‍යතාවය පරිදි රජයේ පිළිගත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගෙන් සහතිකයක් ලබා ගැනීමෙන් තොරව මෝටර් වාහන 17 ක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.1,828,152 ක මුදලක් ගෙවා තිබුණි. |

**(ආ) බේරුම් නොකළ බැරකම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31දිනට වර්ෂ 1 කට අඩු කාලයක් වූ බේරුම් නොකළ බැරකම් රු.1,395,573 ක් විය.

## 4.8 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

(අ) ගැලපුම් කළ යුතු ශේෂ

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක් විසින් 2010 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසුම් ප්‍රකාශනවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විගහයකට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තර | මාස 06 ට වැඩි වර්ෂ 1 ට අඩු | එකතුව |
|---|---|---|---|
| | | රු. | රු. |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | 173 | 173 |
| (ii) | නිකුත්කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 45,811 | 45,811 |
| (iii) | හඳුනා නොගත් හර | 157,399,528 | 157,399,528 |

(iv) හඳුනා නොගත් බැර 95,568 95,568

## 4.9 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී පහත දැක්වෙන පාඩු හා හානි සිදු වූ අවස්ථා නිරීක්ෂණය විය.

(i) 2009 සහ 2010 වර්ෂවලට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් වාර්තා කරන ලද අතිරික්තතා, ඌනතා සහ වෙනත් නිර්දේශයන් පිළිබඳව රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) රු.1,163,650 ක් වූ පාඩු පිළිබඳ විස්තර විසර්ජන ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි.

## 4.10 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2010 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 05 | 01 |
| ii. | තෘතියික මට්ටම | 06 | 04 | 02 |
| iii. | ද්විතියික මට්ටම | 49 | 45 | 04 |
| iv. | ප්‍රාථමික මට්ටම | 39 | 25 | 14 |
| | එකතුව | 100 | 79 | 21 |

## 4.11 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i ඇස්තමේන්තු ප්‍රතිපාදන නොමැතිව නෙස්කැෆෙ මිලදී ගැනීම සඳහා රු.175,490 ක මුදලක් වැයකර තිබුණි. එබැවින් ඉහත ගෙවීම සුබසාධන වැඩසටහනට සාවද්‍යව අයකර තිබුණි.

ii රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගෙන් අනුමැතිය ලබා ගැනිමෙන් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක ගණකාධිකාරීවරුන් සඳහා ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලන ඩිප්ලෝමා පාඨමාලා ගාස්තු රු.450,000 ක් සහ නිල ප්‍රවාහන පහසුකම්ද සපයා තිබුණි.

## 4.12 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 මාර්තු 24 දිනැති අංක 28 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2010 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.

(ආ) ලංසු ලියකියවිලි සහ ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් පිළිබඳ ලියකියවිලි තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කර නොතිබුණි.

(ඇ) ලංසු විවෘත කිරීමේ කමිටුව, ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3 වගන්තිය ප්‍රකාරව වූ ආකෘතියෙහි කමිටු රැස්වීම් සටහන් පිළියෙල කර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.20 (9) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් විසින් ලංසු ලියකියවිලි පිළියෙල කර නොතිබුණි.

(ඉ) රු.4,767,730 ක් වටිනාකම වූ ප්‍රසම්පාදන 06 ක් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් විසින් සැපයුම්කරුවන්ගෙන් කාර්යසාධන බැදුම්කර ලබාගෙන නොතිබුණි.

(ඊ) රු.4,967,650 ක් විටිනාකම වූ ප්‍රසම්පාදනයන් කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.3 වගන්තිය ප්‍රකාරව සැපයුම්කරු විසින් සපයන ලද භාණ්ඩ සඳහා ගබඩා භාර නිලධාරි විසින් සහතික නිකුත්කර නොතිබුණි.

## 4.13 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් මෙහෙයුම් අකාර්යක්ෂමතා නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය තුලදී තෙන්මරච්චි මූලික රෝහලේ ළමා වාට්ටුවක් ඉදිකිරීම සඳහා පරිපූරක ප්‍රතිපාදනයක් වශයෙන් රු.9,886,417 ක මුදලක් ප්‍රතිපාදනය කරන ලදී. ඉදිකිරීම් වැඩ 2010 අගෝස්තු 06 වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු විසින් මෙම කාර්යය 2010 නොවැම්බර් 06 දින භාරදෙන ලදී. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.11,000,000 ක්වූ කොන්ත්‍රාත්කරුගේ බිල්පත්‍රයෙන් රු.9,886,417 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. ප්‍රමාණවත් ප්‍රතිපාදන නොවූ බැවින් ඉතිරි රු.1,657,989 ක මුදල කොන්ත්‍රාත්කරුට ගෙවා නොතිබුණි.

(ආ) ඉහත රු.1,657,989 ක බැරකම විසර්ජන ගිණුමේ ඩීඒඑස්ඒ 9 (ii) ආකෘතියෙහි හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාණකල අලාභ අයකරගෙන නොතිබුණි.

(ඈ) ඉහත ගොඩනැගිල්ල අදහස් කළ කාරණයන් සඳහා 2011 මාර්තු අවසානය දක්වා උපයෝජනය කර නොතිබුණි.

## 4.14 මෝටර් වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෝටර් වාහන සඳහා දෛනික ධාවන සටහන් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් විධිමත්ව පවත්වා නොතිබුණි.

(ආ) පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් කිලෝමීටර 24,656 ක ගමන් සඳහා අත්සන් කර නොතිබුණු අතර අවස්ථා 293 කදී ගමන් කළ ස්ථාන දක්වා නොතිබුණි.

(ඇ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 06 ක විගණනයේදී මෝටර් වාහනවල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කරන ලද අතර, පහත දැක්වෙන විචලනයන් නිරීක්ෂණය විය.

| ආයතනය | වාහන අංකය | ලීටරයක් සඳහා අපේක්ෂිත පරිභෝජනය | තථ්‍ය පරිභෝජනය | විචලනය |
|---|---|---|---|---|
| | | කි.මී. | කි.මී. | කි.මී |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | | | | |
| වලිකාමම් නිරිත | WPPA 3870 | 10 | 8 1/2 | 1 1/2 |
| නල්ලූර් | WPPA 3651 | 10 | 9 | 1 |
| වඩමාරච්චි නිරිත | WPPA 6998 | 10 | 7 | 3 |
| කයිට්ස් | WPPA 3864 | 10 | 10 | - |
| යාපනය | WPPA 7009 | 10 | 9 | 1 |

| | | | | |
|---|---|---|---|---|
| වලිකාමම් උතුර | WPPA 7003 | 10 | 8 1/2 | 1 1/2 |

**4.15 අභ්‍යන්තර පාලනය**

(අ) අභ්‍යන්තර විගණනය

සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කටයුතු ආවරණය කිරීම සඳහා කාර්ය මණ්ඩලය හා අභ්‍යන්තර විගණනයේ ප්‍රමාණය ප්‍රමාණවත් නොවීය. අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2000 ජූනි 12 දිනැති අංක අයිඒඅයි/2000/1 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුලදී එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

**4.16 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව - ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. | ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 35 | 21 |
| ii. | තෘතියික මට්ටම | 87 | 28 | 59 |
| iii. | ද්විතියික මට්ටම | 1,032 | 665 | 367 |
| iv. | ප්‍රාථමික මට්ටම | 238 | 113 | 125 |
| | | 1,413 | 841 | 572 |